## ආයතනයක වගතුග






# සාගර සම්පත් සුරැකුමට කැපවුණු

# 'නාරා'

එක්සත් ජාතීන්ගේ සමුද්‍ර නීතිය පිළිබඳ තුන්වන සම්මේලනයේ ඵලයක් ලෙසින් ශ්‍රී ලංකාවට සැතපුම් 200 ක් පළලැති අනන්‍ය ආර්ථික කලාපයකුත්, ඉන් සැතපුම් සිය ගණනක් ඈතට විහිදී යන මහාද්වීපික ඉම සම්බන්ධයෙන් මහාද්වීපික තටාක පාලනය සඳහා වූ විශේෂ අයිතියකුත් ලැබිණි.

මෙම මුහුදු ප්‍රදේශ ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණය මෙන් විසිගුණයකටත් අධික ය. මේ නිසා විශාල ප්‍රදේශයක සම්පත් පාලනය බාර ගැනීමේ දී ශ්‍රී ලංකාවේ සංවර්ධන උපාය මාර්ගවලට අන්තර්ග්‍රහණය කර ගත හැකි වන පරිදි එම ප්‍රදේශ මනා කළමනාකාරිත්වයකින් පවත්වා ගැනීමේ අවශ්‍යතාව ද ශ්‍රී ලංකාව වෙත පැවරිණි.

එසේම මෙම ප්‍රදේශයේ කළමනාකරණය සඳහා අවශ්‍ය ආයතන දම ආදිය ගොඩනගා ගැනීම ද ශ්‍රී ලංකාවට අවශ්‍ය විය. එහෙයින් ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිත ආයතනය ස්ථාපනය කිරීම සඳහා පනත් කෙටුම් පතක් 1981 අගෝස්තු මාසයේ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. එම "1981 අංක 54 දරණ පනත", 1981 සැප්තැම්බර් 02 වෙනි දින සහතික කරනු ලැබිණි. මේ අනුව 1981 සැප්තැම්බර් 15 වෙනි දින ජාතික ජලජ සම්පත් නියෝජිත ආයතනයේ ප්‍රථම පාලක මණ්ඩලය හිරාන් ඩබ්ලිව්. ජයවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් නම් කරන ලදී.



අධ්‍යක්ෂ ජෙනරල් ඩී. එස්. ජයකොඩි මහතා

මෙම ආයතනය එහි ඉංග්‍රීසි නමේ මුලකුරු එක්කිරීමෙන් සැදුණු "නාරා" යන කෙටි නමින් වඩාත් ප්‍රසිද්ධ ය.(National Aquatic Resources Agency)

ඉහත සඳහන් පනත අනුව ජලජ සම්පත් පිළිබඳ විෂය සම්බන්ධයෙන් පර්යේෂණ, සංවර්ධන හා කළමනාකරණ කටයුතු කරගෙන යාමේ හා සම්බන්ධීකරණය කිරීමේ වගකීම බාර ප්‍රධාන ජාතික ආයතනය 'නාරා' ආයතනයයි.

මෙම නාරා ආයතනයේ අරමුණු හා ක්‍රියාකාරකම් පිළිබඳ ව එහි අධ්‍යක්ෂ ඩී. එස්. ජයකොඩි මහතා මෙසේ පැහැදිලි කළා:

* සජීවී හා අජීවී සම්පත් ක්ෂේත්‍රයෙහි ජාතික සංවර්ධන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙහිලා විද්‍යාත්මක හා තාක්ෂණික දැනුම හා අවබෝධය ක්‍රමවත් ආකාරයෙන් යෙදේ ද යන්න සොයා බැලීම.
* සමුද්‍රජීවී හා ගොඩතර ජලජ ක්ෂේත්‍රයෙහි සම්පත් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය සහ සංවර්ධනය කිරීම උදෙසා එම ක්ෂේත්‍රවලට අදාළ පර්යේෂණ කටයුතු මෙහෙයවීම හා ඒ සඳහා උද්යෝගිමත් කිරීම
* ධීවරයන් සහ ඔවුන්ගේ යැපෙන්නන් ද ඇතුළුව ධීවර කර්මාන්තයට අදාළ වන පරිදි සාමාජීය හා ආර්ථික අධ්‍යයනයන් මෙහෙයවීම.
* අල්ලාගනු ලබන මසුන්ගේ හා මත්ස්‍ය නිෂ්පාදනවල පාලන කටයුතු මෙහෙයවීම හා මත්ස්‍යමය නිෂ්පාදන ඇති කිරීම උදෙසා අවශ්‍ය තාක්ෂණය හා තාක්ෂණික තත්ත්වයන් වැඩිදියුණු කිරීම.
* ගොඩතර ජලාශ වෙරළාසන්න තෙත්බිම්, ගොඩ මුහුද හා ගැඹුරු මුහුද යන ප්‍රදේශවල ඇති ජලජ සම්පත් සංවර්ධනය කළමනාකරණය හා සංරක්ෂණය සඳහා උපදෙස් ලබාදීම
* සාගරමය හා ජල සමුද්‍රීය ගවේෂණ කටයුතු කිරීම, දත්ත ගබඩා කර තැබීම හා අදාළ සිතියම් නිර්මාණය කිරීම
* සජීවී හා අජීවී ජලජ සම්පත් ක්ෂේත්‍රයේ සම්පත්වලින් ඵල නෙළා ගැනීම ඒ සඳහා සැලසුම් කිරීම, පර්යේෂණ හා සංවර්ධන ක්‍රියා ඇති කිරීම යන කරුණු උදෙසා අවශ්‍ය විද්‍යාත්මක තාක්ෂණික නීතිමය, විශේෂඥ දැනුම හා උපදෙස් ලබාදීම.
* ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සහ සජීවී හා අජීවී ජලජ සම්පත් සංවර්ධනය පිණිස අවශ්‍ය තොරතුරු සහ දත්ත එක්රැස් කිරීම, බෙදාහැරීම, ප්‍රකාශන පළකිරීම, නියෝජිත ආයතනයේ රාජකාරි කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය අදාළ නිලධාරීන්ට පුහුණුව

ලබා දීම. යන කරුණු මෙම නියෝජිත ආයතනයේ අරමුණු හා ක්‍රියාකාරකම් ලෙස හඳුන්වන්න පුළුවන්. මේවා ඉටුකිරීම සඳහා මෙම ආයතනය ප්‍රධාන අංශ අටකට වෙන්කොට තිබෙනවා. ඒවා මේ ආකාරයට දැක්වි ය හැකි ය.

සමුද්‍රජීවී අංශය, ගොඩතර ජලජීවී රෝපන අංශය, පරිසර අධ්‍යයන අංශය, තාක්ෂණ අංශය, පසු අස්වනු තාක්ෂණික අංශය, ජල ශාස්ත්‍රීය කාර්යාලය, සාගර විද්‍යා අංශය, පුස්තකාලය හා තොරතුරු අංශය මෙම ප්‍රධාන අංශවලට ආධාර කරන අංශ තුනක් තිබෙනවා. මුදල් අංශය, පරිපාලන අංශය, සේවා හා මෙහෙයුම් අංශය.

එසේම මෙම ආයතනය අර්ධ රාජ්‍ය ආයතනයක් ලෙස පවත්වාගෙන යනවා යැයිද තවදුරටත් අදහස් දක්වමින් අධ්‍යක්ෂ ඩී. එස්. ජයකොඩි මහතා පැවසී ය.

## සමුද්‍රජීවී සම්පත් අධ්‍යයන අංශය

සමුද්‍රජීවී සම්පත් කළමනාකරණය සඳහා අවශ්‍ය පර්යේෂණ මෙහෙයවීම මෙම අංශයේ වගකීමක්. දැනට මෙම අංශය මගින් මෙහෙයවනු ලබන පර්යේෂණ ව්‍යාපෘති අරමුණු කර ඇත්තේ සාගර ජීව සම්පත් සුදුසු පරිදි පරිහරණය සඳහා උචිත වන ආකාරයෙන් එම සම්පත් සංරක්ෂණය, කළමනාකරණය සහ සංවර්ධනය කිරීම සඳහා යි.

වෙරළාසන්න ධීවර සම්පත් සම්බන්ධයෙන් කරන ලද ඇගයීම්වල ප්‍රතිඵලයක් ලෙස ධීවර දෙපාර්තමේන්තුව මගින් ඒ සම්බන්ධ කළමනාකරණ නිර්දේශයන් සහ අවශ්‍ය නීතිරීති සම්පාදනයට හැකිවී තිබෙනවා. ශ්‍රී ලංකාවේ ගිනිකොණ දිග මුහුදේ කුඩා මසුන් සම්බන්ධයෙන් කරන ලද ජෛව සමාජ ආර්ථික අධ්‍යයනයේ ප්‍රතිඵලයක් ලෙස විකල්ප කළමනාකරණ ක්‍රම යෝජනා කිරීමට හැකි වී තිබෙනවා. බටහිර දිග මුහුදේ විශේෂයෙන් ම මීගමු ප්‍රදේශයේ ධීවර කර්මාන්තයේ යෙදී ඇති යාත්‍රා සංඛ්‍යාව අඩු කිරීමත්, සමහර මත්ස්‍ය විශේෂවල කිට අවදි අසුවීම අවම කිරීම සඳහා දැල් ඇස් ප්‍රමාණය සීමා කිරීමේ අවශ්‍යතාවත් මෙම අංශය මගින් යෝජනා කර තිබෙනවා. පුත්තලම/මුන්දලම කරදිය වගුරු ආශ්‍රිත ප්‍රදේශයේ විවිධ ධීවර ක්ෂේත්‍ර අයත් වන ලෙස කරන ලද අධ්‍යයනයක ප්‍රතිඵලයක් ලෙස මෙම ප්‍රදේශය සඳහා කළමනාකරණ සැලැස්මක් ඉදිරිපත් කිරීමට හැකිවී තිබෙනවා යැයි ආචාර්ය ඩබ්. එම්. ටී. බී. වන්නිනායක මහතා කියා සිටියේ ය.



ආචාර්ය
ඩබ්. එම්. ටී. බී. වන්නිනායක



ආචාර්ය පී. පී. ජී. එස්. එන්.
සිරිවර්ධන මහතා

ශ්‍රී ලංකාවේ විවිධ සාගර ප්‍රදේශවල විසිරී ඇති කොරල් පර පරිසර පද්ධති සම්බන්ධව කරන ලද අධ්‍යයනවල ප්‍රතිඵලයක් ලෙස මුහුදු අභය භූමි දෙකක් ප්‍රකාශයට පත් කිරීමට හැකි වුණා. එනම් හික්කඩුව සහ කුන්දක්කුලිය ප්‍රදේශයේ බාරිෆ් පරය වශයෙන් හැඳින්විය හැකියි. කොරල්පර සංරක්ෂණය කිරීම ධීවර කර්මාන්තයට හොඳ එලදවක් ලබා ගැනීමට අතිශයින් වැදගත් වෙනවා.

ගැඹුරු දිය ධීවර කර්මාන්තය නගා සිටුවීමට මහත් බාධාවක් වී ඇත්තේ ඒ හා සම්බන්ධව නිරවද්‍ය තොරතුරු අප සතුව නැති කමයි. දැනට 'නාරා' ආයතනය මගින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන වරායවල් හා මසුන් ගොඩබානු ලබන තොටුපොළවල් ආශ්‍රිතව දත්ත එක්රැස් කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනවා.

ධීවර යාත්‍රා වලට දත්ත සටහන් පොත් බෙදදීම මගින් මෙම දත්ත එක්රැස් කිරීමේ කාර්යය තවදුරටත් ශක්තිමත්ව කෙරෙමින් පවතිනවා. ධීවර කාර්මිකයන්ට ද මෙම කාර්යයට සහභාගී වීමට ඉඩ ප්‍රස්ථා ලබා දී තිබෙනවා. නාරා ආයතනය මගින් දැනට දියත් කර ඇති සම්පත් ගවේෂණ වැඩසටහන මගින් අපට අයත් ආර්ථික කලාපය තුළ මුහුදේ බලයන්, කෙලවල්ලන්, අලගුඩුවන් වැනි මසුන්ගේ සංක්‍රමණ රටා පිළිබඳව තොරතුරු රැස් කිරීමට අදහස් කර ගෙන සිටිනවා. මෙම ගවේෂණ තොරතුරු මාස තුනකට වරක් වාර්තා කරන අතර අල්ලා ගනු ලබන මසුන් පිළිබඳ වාර්තා, එසේ අල්ලා ගනු ලබන ස්ථාන හා අල්ලා ගනු ලබන මත්ස්‍ය වර්ග පිළිබඳව අලුත්ම තොරතුරු ධීවර ප්‍රජාව අතර බෙද දෙනු ලබනවා යැයි ඒ මහතා වැඩි දුරටත් අදහස් දැක්වී ය.

## ගොඩතර ජලජීව රෝපණ අංශය.

මෙම අංශයේ ආචාර්ය පී. පී. ජී. එස්. එන්. සිරිවර්ධන මහතා මෙසේ පැවසුවා :

## ඇදුම මඩින මාළු තෙල්

තෙල් බහුල මාළු නිතර ආහාරයට දීමෙන් ළාබාල දරුවන්ට ඇදුම හට ගැන්මට තිබෙන අවධානය අඩු කර ගත හැකි බව ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර ශ්වසනවේදය පිළිබඳ වෛද්‍ය ආයතනයේ වාර්තාවකින් පැවසේ.

ශ්වසන ආබාධ කෙරෙහි පිළියම් කාරක බලපෑමක් ඇතිකරන බවට වාර්තා වන ඔමේගා - 3 (OMEGA - 3)නම් මේද වර්ගය මත්ස්‍ය තෙලෙහි අඩංගුවීම එයට හේතුවයි.

තෙල් බහුල මසුන් ලෙස හැඳින්වෙන්නේ මත්ස්‍ය තෙල් 2% කට වඩා වැඩි ප්‍රමාණයක් ඇති මාළු වර්ග ය. පරවා, මුහුදු ගල් මාළු, කෙලවල්ලා, හා පිරිමි තෝරා (සවරා) ආදී මත්ස්‍ය වර්ග ඉන්දියන් සාගරයේ දක්නට ලැබෙන තෙල් සහිත මසුන්ගේ ගණයට අයත් වෙයි.



ගොඩතර ජලජ සම්පත් ජලජීවී වගා අංශයේ රසායනාගාරයේ පරීක්ෂණයක්



මුහුදේ ගැඹුර මැනීමට යොදගත් උපකරණයෙන් පරිගණකයට දත්ත යොමු කිරීම



පසුතාක්ෂණ අංශයේ රසායනාගාර කටයුතු කෙරෙන අවස්ථා



ආචාර්ය
කේ. එම්. පී. ජයසිංහ



ආචාර්ය
කමල් තෙන්නකෝන් මහතා



එම්. ආරියවංශ
මහතා

මිරිදිය හා කිවුල් දිය ආශ්‍රිත පරිසර පද්ධතිවල සම්පත් ජලජීව වගාව හා ගොඩතර ජලජ සම්පත් අධ්‍යයනය හා ඒවා කළමනාකරණය සඳහා අවශ්‍ය උපදෙස් සැපයීම මේ අංශයට බාර ප්‍රධාන කාර්යයක් හැටියට කියන්න පුළුවන්.

ජලජීව රෝපණයට අදාළව පාරිසරික තත්ත්වය ඇගයීම හා කළමනාකරණය, ඉස්සන්, බෙල්ලන්, කිවුල්දිය මසුන්, මුහුදු කුඩැල්ලන් හා ආටිමියා වැනි ජීවීන් වගා කිරීමට අවශ්‍ය තාක්ෂණ ක්‍රමවල නිරවද්‍යතාවන් සොයා බැලීම ආදිය මෙම අංශයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු වලට අදාළ වෙනවා.

මෙම අංශයේ අවධානය යොමුවී ඇති වෙනත් ක්ෂේත්‍ර ලෙස මත්ස්‍ය රෝග පැතිරීම පාලනය, ජලජීව රෝපණ ස්ථාන වලින් පිට කරන අපද්‍රව්‍ය සුදුසු තත්ත්වයකට පත් කිරීමට කටයුතු යෙදීම, ශ්‍රී ලංකාවට ආවේණික සුරතල් මත්ස්‍ය විශේෂ අභිජනනය, කකුළුවන් තර කිරීම සහ වැව්වල ධීවර කර්මාන්තය කළමනාකරණයට භාජනය කිරීම ද අයිතියි. ධීවර කර්මාන්තයට අදාළව දියුණු කළ තාක්ෂණික ක්‍රම ධීවර ජනතාවට බෙදා හැරීම සඳහා ජනතා සහභාගිත්වය ඇතුව කරනු ලබන වැඩසටහන් ද මෙම අංශය මගින් සංවිධානය කරනවා.

තවත් මෙවැනි වැඩපිළිවෙළක් ලෙස සුරතල් මත්ස්‍ය වගාව පිළිබඳව ලිඛිත හා ප්‍රායෝගික පාඨමාලාවක් ද පවත්වනවා. එහි ප්‍රතිඵලයක් ලෙස දුෂ්කර ප්‍රදේශවල පවා සුරතල් මසුන් වගා කිරීමේ කටයුතු දියුණු කිරීම සඳහා පියවර ගැනීමට හැකි වී තිබෙනවා.

බෙල්ලන් වගාව, මුහුදු පාසි වගාව, ඉස්සන් වගාව සහ මත්ස්‍ය රෝග සඳහා තොරතුරු පත්‍රිකා පිළියෙළ කර ඒවා කර්මාන්තකරුවන්හා ආයෝජකයන් අතර බෙදා හැරීමෙන් ඔවුන් තුළ මෙම කර්මාන්තය කෙරෙහි වැඩි දැණුවත්කමක් ඇති කිරීමට හැකිවී තිබෙනවා.

කඩොලාන සහිත ප්‍රදේශ, ලවනතා සහිත ප්‍රදේශ, වගුරුබිම්, තෙත්බිම් ආදී පරිසර පද්ධති රැක ගැනීමට අවශ්‍ය සමීක්ෂණ හා සංරක්ෂණ වැඩපිළිවෙල් දැනටමත් ක්‍රියාත්මක කර තිබෙනවා. ඒම නිසා පරිසරය සුරැකීමටත් කලපු වලින් උපරිම නිෂ්පාදන තාවක් ලබා ගැනීමට පුළුවන්.

### ලංකාව අවට කොරල් පරවල පිහිටීම

| පිහිටීම | ගැඹුර මීටර් | සජීව කොරල් ප්‍රතිශතය |
|---|---|---|
| බාරිෆ් පරය | 0-8 | 0% |
| කොළඹ | 15-22 | 6.0% |
| හික්කඩුව | 0-4 | 7.0% |
| මීගමුව | 15-22 | 14.4% |
| වැලිගම | 0-4 | 28% |
| පරෙවි දූපත | 0-5 | 40% |

## පරිසර අධ්‍යයන අංශය

මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය ගොඩතර ජලාශ, වෙරළ අසල ප්‍රදේශ හා ගැඹුරු මුහුද වශයෙන් පවතින පරිසර පද්ධතිවල පාරිසරික තත්ත්වයන් පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම යි. මේ පිළිබඳ විස්තරාත්මකව සැලකූ විට ජලාශ වලට හා වෙරළාසන්න මුහුදු තීරයට කෘෂිකාර්මික රසායනික ද්‍රව්‍ය තැන්පත් වීම, ජලය හා මසුන් තුළ කෘෂි රසායන ද්‍රව්‍ය තැන්පත් වීම හා කර්මාන්තශාලා වලින් බැහැර කරන අපද්‍රව්‍ය නිසා ජලජ පරිසර දූෂණය වීම හඳුරීම ආදී කරුණු අයත් වෙනවා. නාරා ආයතනය මගින් කරනු ලබන මෙම පරීක්ෂණ තොරතුරු හා අප රටේ ජලජ පරිසරය දූෂණය වී ඇති ප්‍රමාණයන් තිරණය කිරීමෙන් අදාළ නීතිරීති පනවන මධ්‍යම පරිසර අධිකාරිය වැනි ආයතනවලට අතිශයින් වැදගත් වෙනවා.

මුතුරාජවෙල පාරිසරික කමිටුව, ජාතික ජලසම්පත් හා පාරිසරික සංරක්ෂණ ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ආදී ආයතනවලට අවශ්‍ය විට දී ජලජ පරිසරය සම්බන්ධයෙන් උපදෙස් සැපයීම, තාක්ෂණික ඇගයීම් සඳහා සහභාගි වීම, ජෛව විවිධත්වය හා වෙනත් පාරිසරික කරුණු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම ද මෙම අංශයෙන් කෙරෙනවා යැයි හේමන්ත දසනායක මහතා වැඩිදුරටත් පැවසී ය.

## පසු තාක්ෂණික අංශය

විවිධ ධීවර පත්න ක්‍රම මගින් ලබා ගන්නා ධීවර සම්පත් ප්‍රයෝජනයට ගත හැකි පරිදි ඉතා උචිත අන්දමට නැවත සකස් කිරීම සඳහා උපදෙස් සැපයීම මෙම අංශයේ මූලික කාර්යයක් වෙනවා.

මේ අනුව මුහුදු පාසි, බෙල්ලන්, ඉස්සන්ගේ ඉවත දමන කොටස් ආදිය යොදා ගනිමින් ප්‍රෝටීන් බහුල හා අඩු වියදම් ක්ෂණික ආහාර වර්ග නිෂ්පාදනය කිරීම අරමුණු කොට ගෙන තිබෙනවා යැයි



ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු නානායක්කාර මහතා සයුරි නැවේ සිට



මුහුදු සිතියම් ගැනීමට යන සයුරි නැවේ කාර්යමණ්ඩලය, ජේ. සී. එන්. සිල්වා, සමන් කුමාර, එස්. එම්. ඉලේසිංහ



පසු අස්වනු අංශයේ රසායනාගාරයේ පරීක්ෂණයක් කරමින්

ආචාර්ය කේ. එම්. පී. ජයසිංහ මහතා පසු තාක්ෂණ අංශය පිළිබඳව පැවසී ය. ඒ මහතා තවදුරටත් අදහස් දක්වමින් මෙසේ කියා සිටියා.

කරවල සෑදීම, ජාඩිදැමීම, උම්බලකඩ සෑදීම වැනි පාරම්පරිකව කෙරිගෙන එන මසුන් කල්තබා ගන්නා ක්‍රමවලට නව තාක්ෂණික මුහුණුවරක් දී ඒවායේ තත්ත්වය තවත් දියුණු කිරීමට ද අපනයනය කරනු ලබන ආහාරවල තත්ත්වයත් පිළිබඳව සහතික නිකුත් කිරීමක් ද මෙම අංශය මගින් සිදු කෙරෙනවා.

මෙම ක්ෂේත්‍රයේ කටයුතු කරන මහා පරිමාණ හා සුළු පරිමාණ කර්මාන්ත කරුවන්ට පෞද්ගලිකව හෝ උපදේශක සේවා මගින් විශේෂඥ සේවා ලබාදීම ද මෙම අංශයෙන් කෙරෙන කටයුත්තක්.

මේද බහුල කුඩා මසුන්, මසුන්ගෙන් ඉවත දමන කොටස් යොදා තෙල් නිපදවීමේ ක්‍රම පිළිබඳව මෙම අංශය අවධානය යොමු කොට තිබෙනවා. මේ මගින් රැකියා අවස්ථා වැඩි කර ගැනීමට ද බලාපොරොත්තු වෙනවා. ඉදිරියේ දී මසුන් පිළිබඳව සමාජ ආර්ථික අධ්‍යයනයක් කිරීම සඳහා වැඩි අවධානයක් යොමුකරනවා.



පර්යේෂණ නිලධාරී
ඒ. රාජසූරිය



ව්‍යාපෘති නිලධාරී
ආනන්ද ලාල් ලියනගේ



පර්යේෂණ නිලධාරී
දේවප්‍රිය අමරසූරිය

| | |
|---|---|
| IWC | - අන්තර්ජාතික තල්මස් කොමිසම |
| ICLARM | - සජීව ජලජ සම්පත් කළමනාකරණය පිළිබඳ අන්තර්ජාතික මධ්‍යස්ථානය |
| BOBP | - බෙංගාල බොක්ක ව්‍යාපෘති |

## ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලය

නාරා ආයතනයට අයත් වූ ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලය, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ද සහයෝගයෙන් 1984 දී පිහිටුවනු ලැබුවා. දැන් එය ජාත්‍යන්තර ජල ශාස්ත්‍රීය කාර්යාලය හා අනුබද්ධ කළාට පසුව ශ්‍රී ලංකාවේ ජල ශාස්ත්‍රය කෙරෙහි මූලිකත්වය ගෙන කටයුතු කරන ජාතික ආයතනයක් බවට පත්වුණා.

මෙම කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් අතරට ගොඩතර ජලාශ, වෙරළාසන්න මුහුද, අක් වෙරළ හා ශ්‍රී ලංකාවට අයිති ආර්ථික කලාපයේ පිටත මායිම් තෙක් සාගර ප්‍රදේශය තුළ සවිස්තරාත්මක ජල ශාස්ත්‍රීය කටයුතු කිරීමට බාර වී තිබෙනවා යැයි එම්. ආරියසිංහ මහතා ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලය පිළිබඳව පැවසී ය.

මෙහි ප්‍රතිඵලයක් ලෙස නාවික හා ධීවර සිතියම් සෑදීම ජල ශාස්ත්‍රීය කටයුතුවල නිරත විවිධ අයගේ ප්‍රයෝජනය සඳහා වෙනත් සිතියම් (මුහුදේ ගැඹුර ආදී) නිපදවීම කෙරෙනවා.

මෙම සිතියම් සාගරයේ පර්යේෂණ කටයුතු, කළමනාකරණ සැලසුම් හා නාවික කටයුතුවලට යොදා ගන්නවා.

තොටුපොළවල් සංවර්ධනය, වරායවල් සංවර්ධනය, වෙරළාසන්න කටයුතු කළමනාකරණය, සාගරමය සම්පත් ගවේෂණය සාගර සීමා නිර්ණය කිරීම, සාගරයේ පරිසර දූෂණ ප්‍රදේශ නිර්ණය කිරීම, වෙරළ සංරක්ෂණ කටයුතු සඳහා දත්ත සැපයීම, වෙරළාශ්‍රිත ඉන්ජිනේරු කටයුතු සහ ආරක්ෂාකාරීව යාත්‍රා පැදවීම යනාදී කාර්යයන් සඳහා මෙම කාර්යාලයේ කටයුතු අතිශයින් වැදගත් වෙනවා යැයි ඔහු වැඩිදුරටත් කියා සිටියේ ය.

## සාගර විද්‍යා අංශය

මෙම අංශයේ ආචාර්ය කමල් තෙන්නකෝන් මහතා අදහස් දක්වමින් මෙසේ කියා සිටියා. ධීවර පන්න ක්‍රම හා තාක්ෂණ සම්බන්ධයෙන් අවශ්‍ය පර්යේෂණ හා සංවර්ධන වැඩ කටයුතු කරමින් මෙම අංශය ධීවර ක්ෂේත්‍රයට විශාල සේවාවක් ඉටු කරනවා.

මෙම අංශය මගින් මෑතක දී හඳුන්වා දුන් තොරතුරු අනුව මාළු ඒකරාශී වීමේ ඇටවුම් හඳුන්වා දීම කියන්න පුළුවන්. මෙය සුළුකාර්මික ධීවරයන්ට ආදායම් තත්ත්වය ඉහළ දැමීමට හේතුවක් වුණා.

දැනට මෙම අංශය මගින් කරගෙන යනු ලබන පරීක්ෂණ අතර පොකිරිස්සන්ගේ සුරුකුම් බිම් සඳහා කැසිටා තැන්පත් කිරීම වැදගත් තැනක් ගන්නවා. මෙම ව්‍යාපෘතියේ සාර්ථකත්වය අනුව පොකිරිස්සන් නිෂ්පාදනය වැඩිකිරීමේ විදේශ විනිමය ප්‍රමාණය වැඩිකර ගැනීමටත් බලාපොරොත්තු වෙනවා.

## පුස්තකාල හා තොරතුරු අංශය

මෙම ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා දත්ත එක්රැස් කිරීම, බෙදාහැරීම හා තොරතුරු ප්‍රකාශයට පත්කිරීම මෙම අංශය මගින් කරනු ලබනවා.

මෙම අංශයට අයත් පුස්තකාල ලිපි ලේඛන, විද්‍යුත් තැටි, පරිගණක ගත කළ තොරතුරු ආදිය නිසා ධීවර ක්ෂේත්‍රයට අදාළව කටයුතු කරන අයටත්, උසස් අධ්‍යාපනය හදාරණ අයටත්, ධීවර සංවර්ධන කටයුතු කරන අයටත් පහසුවක් වෙනවා යැයි අමරසූරිය මහතා පැවසී ය. ❑



පුස්තකාලයේ පරිගණක අංශය



ගැඹුරු දිය පරීක්ෂාකරණ උපකරණය

**ඉන්දික කුඩාහෙට්ටි**

ඡායාරූප :
**සිරිසේන තුඩුවගේ**